# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,685/15—1966 මාර්තු 10 වැනි බ්‍රහස්පතින්දා—10.3.1966

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.—බී. 88/48

**1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාව**

**47 (2) වන වගන්තිය යටතේ වූ නිවේදනය යි**

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 වන වගන්තියෙහි (2) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ඇමති ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම (40 වැනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ මා විසින් ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා අගමැතිවරයා විසින් දෙනු ලැබූ බලය හැර, යම් ලිඛිත නීතියකින් මා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලුම බලතල හා යුතුකම් මාගේ පාර්ලිමේන්තු ලේකම් දෙන් පීටර් අතපත්තු වෙත, නැවත දැනුම් දෙන තුරු මේ නිවේදනයෙන් පවරමි.

ජේ. ආර්. ජයවර්ධන,
රාජ්‍ය ඇමති.

1966 මාර්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

358/47—ආර් 12833—10,250 (66/3)